සැ. යු. - 2013.05.31 දින පළ වූ අංක 1,813 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,814 - 2013 ජූනි මස 07 වැනි සිකුරාදා - 2013.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 834 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 835 |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 836 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 843 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* (i) මෛත්‍රීපාල සිරිසේන ලක්දරු දිරිය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 අප්‍රේල් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 අප්‍රේල් මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූනි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූනි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ප්‍රසම්පාදන දැන්වීමයි**

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

**පාවිච්චි කරන ලද වාහන විකිණීම**

සභාපති, ප්‍රසම්පාදන කමිටුව, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් පහත විස්තර සඳහන් පාවිච්චි කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු. අංකය | වාහන අංකය | වර්ගය | ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල රු. | ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|
| 01. | 19-7647 | නිසාන් සනී මෝටර් කාර් | 15,000 | 1,000 |
| 02. | 65-6664 | ඉසුසු ට්‍රෑපර් ජීප් රථය | 15,000 | 1,000 |
| 03. | HH -7458 | මහින්ද්‍රා බොලරෝ ජීප් රථය | 15,000 | 1,000 |
| 04. | KE -4830 | මයික්‍රෝ රේක්ස්ටන් ජීප් රථය | 15,000 | 1,000 |

මෙම විකිණීමට ඉදිරිපත් කර ඇති වාහන, අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ 03, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශ භූමියේ නවතා ඇති අතර, 2013.06.10 වැනි දින සිට 2013.06.21 වැනි දින දක්වා කාර්යාල දිනයන්හි පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා පරීක්ෂාකර බැලිය හැක.

මෙම වාහන විකිණීම සඳහා මිල ගණන් පත්‍ර නිකුත් කිරීම 2013.06.10 වැනි දින සිට 2013.06.21 වැනි දින දක්වා පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා සිදු කෙරේ. ඉහත දැක්වෙන ආපසු නොගෙවන ගාස්තු ප්‍රධාන ගණකාධිකාරී නමින් ගෙවා ලබාගත් රිසිට් පත්, ගණකාධිකාරී (සැපයීම්) වෙත ඉදිරිපත් කර ආදළ මිල ගණන් පත් ලබාගත හැක.

එක් එක් වාහනය සඳහා වෙන වෙනම මිල ගණන් පත් ඉදිරිපත් කළ යුතු ය. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන තැන්පතුව ගෙවා තිබිය යුතු අතර එම කුවිතාන්සියේ මුල් පිටපත අනිවාර්යයෙන් ම මිල ගණන් සමග අමුණා ඉදිරිපත් කළ යුතු ය.

මුද්‍රා තබන ලද මිල ගණන් පත් 2013.06.10 වැනි දින සිට 2013.06.24 වැනි දින පෙ. ව. 10.00 දක්වා වැඩ කරන දිනයන්හි දී ගණකාධිකාරී (සැපයීම්) ගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය. එසේ නැතහොත් මුද්‍රා තබන ලද මිල ගණන් පත් ඉහත ලිපිනයට නියමිත දින නියමිත වේලාවට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මිල ගණන් පත්‍රිකා බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වාහන විකිණීම සඳහා මිල ගණන් වාහන අංක .................... " යනුවෙන් සඳහන් කළ යුතු ය. මිල ගණන් පත් භාර ගැනීම 2013.06.24 වැනි දින පෙ. ව. 10.00 ට අවසන් වන අතර මිල ගණන් පත් විවෘත කිරීම මිල ගණන් පත් භාර ගැනීම අවසන් වූ වහාම සිදු කෙරේ. ඒ සඳහා ඔබ හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකු අනිවාර්යයෙන් සහභාගි විය යුතු ය.

මෙම විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති වාහන විකිණීමෙන් ඉවත් කර ගැනීම හෝ මිල ගණන් ලබා ගැනීමෙන් පසුව විකිණීම අවලංගු කිරීම අමාත්‍යාංශ ලේකම් ගේ අභිමතය පරිදි සිදු වේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය නම් අංක 011-2541379 ඇමතීමෙන් ගණකාධිකාරී (සැපයීම්) වෙතින් හෝ අංක 011-2328344 ඇමතීමෙන් ප්‍රවාහන නිලධාරී වෙතින් ලබා ගත හැකි බව දන්වමි.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

අංක 45, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

06-145

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - හෙට්ටිපොල**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් කිසිවෙකු හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2013.06.22 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයක් හෝ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු සිටිනම් වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර හෝ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්තැනගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන යම් භාණ්ඩයක් එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසිය පවත්වන වේලාවේ දීම එය ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ගෙන එන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව පහත දැක්වේ.

බුද්ධිනී අබේසිංහ,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
හෙට්ටිපොල.

2013 මැයි මස 13 වැනි දින,
හෙට්ටිපොල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2013.06.22 වැනි දින හෙට්ටිපොල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ |
|---|---|---|
| 1. | 4523 | ලියාපදිංචි අංකය නොමැති චැසි අංක 8872 දරන සීපැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය සහ පරණ ටේලරය |
| 2. | 52387 | ලියාපදිංචි අංක 70 ශ්‍රී 6670 දරන කුබෝටා වර්ගයේ අත් ට්‍රැක්ටරය සහ පරණ ටේලරය |
| 3. | 6356 | අංකය අපැහැදිලි සීපැන් වර්ගයේ පරණ අත් ට්‍රැක්ටරය සහ පරණ ටේලරය |
| 4. | 2842 | අංක එන්. එම්. එච්. වයි. 9732 දරන අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 5. | 1891 | ලියාපදිංචි අංක නොමැති චැසි අංක කේ. ඊ. ඩී. 00789 සී. ඒ. එන්ජින් අංක සී. ඩී. 0816389 දරන ලොක් පැන් වර්ගයේ පරණ අත් ට්‍රැක්ටරය සහ පරණ ට්‍රේලරය. |
| 6. | 5926 | ලියාපදිංචි අංකය නොමැති සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය සහ පරණ ට්‍රේලරය |
| 7. | 7452 | ලි. ප. අංක 130-3419 හොණ්ඩා චැලි වර්ගයේ යතුරු පැදිය |
| 8. | 8209 | ලියාපදිංචි අංක එන්. ඩබ්ලිව්. ජේ. එන්. 6254 බජාජ් කැලිබර් වර්ගය යතුරු පැදිය |
| 9. | 3843 | ලියාපදිංචි අංක එන්. ඩබ්ලිව්. ටී. යූ, 0411 ලොන්සින් එල් එක්ස් 125 යතුරුපැදිය |
| 10. | ඒ. 468/11 | ලියාපදිංචි අංක නැත. එන්ජින් අංකය 164868 යතුරුපැදිය |
| 11. | 4558 | ලියාපදිංචි අංකය එන්. ඩබ්ලිව්. ජී. ටී. 2980 හොණ්ඩා සීඩී 50 යතුරුපැදිය |
| 12. | 4921 | ලියාපදිංචි අංකය එන්. ඩබ්ලිව්. යූ. යූ, 1249 ඩිස්කවරි 135 යතුරුපැදිය |
| 13. | 291 | ලියාපදිංචි අංකය 126-8735 යමහා මේට් වර්ගය යතුරුපැදිය |
| 14. | ඒ 556/11 | ලියාපදිංචි අංකය එන්. ඩබ්ලිව්. එච්. එක්ස්. 7036 පර්සර් 150 යතුරුපැදිය |
| 15. | 01/12 | ලියාපදිංචි අංකය එස් පී ඩබ්ලිව් කේ 3847 බජාජ් කැලිබර් යතුරුපැදිය |
| 16. | බී 426/11 | ලියාපදිංචි අංක එන් ඩබ්ලිව් එච් යූ 6081 හොණ්ඩා සීඩී 125 යතුරුපැදිය |
| 17. | 6676 | වර්ගය අපැහැදිලි කාන්තා පාපැදිය |
| 18. | 7218 | අංක 7087069 ලුමාලා පාපැදිය |
| 19. | ඒ 415/11 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 20. | බී 571/12 | ලැගේජ් එක සහිත අංක 15077994 පාපැදිය |
| 21. | ඒ 572/12 | ටුමැකෝ කාන්තා පාපැදිය |
| 22. | 13084 | යකඩ ගෑස් ලිප<br>ගෑස් සිලින්ඩරය (එස් එච් ඊ එල් එල් 12.5 කේ ජී) |
| 23. | 13083 | යකඩ ගෑස් ලිප<br>ගෑස් සිලින්ඩරය (එල් අයි ටී ආර් ඕ 12.5 කේජී) |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ |
|---|---|---|
| 24. | 12711 | යකඩ ගෑස් ලිප |
| | | ගෑස් සිලින්ඩරය (එල් ඒ යූ ජී එප් එස් 12.5 කේජී) |
| 25. | 8210 | යකඩ ගෑස් ලිප |
| | | ගෑස් සිලින්ඩරය (එල් අයි ටී ආර් ඕ කේ ජී 12.5) |
| 26. | 13618 | ගෑස් සිලින්ඩරය (එල් අයි ටී ආර් ඕ කේජී 12.5) |
| | | යකඩ ගෑස් ලිප |
| 27. | 119/12 | ඉෆ්රෝ වර්ගයේ ජංගම දුරකථනය |
| 28. | බී 570/12 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 29. | 13702 | කේ 103 ජංගම දුරකථනය |
| 30. | 12983 | ජංගම දුරකථනයක් |
| 31. | 8576 | කේජී 10 දුනු තරාදියක් |
| 32. | 10437 | කේජී 10 දුනු තරාදියක් |
| 33. | 6489 | කේජී 10 දුනු තරාදියක් |
| 34. | 10432 | කේජී 10 දුනු තරාදියක් |
| 35. | 8534 | ලීටර් 02 ප්‍රමාණයේ ද්‍රව මිම්මක් |
| 36. | 12983 | අඟල් 12 වර්ණ රූපවාහිනිය සහ වීසීඩී යන්ත්‍රය |
| 37. | 8491 | යකඩ මිට සහිත සවල |
| 38. | 7287 | යකඩ මිල සහිත සවල |
| 39. | 7356 | ලී මිට සහිත සවල |
| 40. | 7037 | ලී මිට සහිත සවල |
| 41. | ඒ 119/12 | යඩක මිට සහිත සවල |
| 42. | නඩු අංක රහිත | යකඩ මිට සහිත සවල් 02 |
| 43. | නඩු අංක රහිත | ලී මිට සහිත සවල් 02 |
| 44. | බී 904/11 | ලී මිට සහිත සවල |
| | | ලී මිට සහිත උදැල්ල |
| 45. | බී 566/12 | යකඩ ඉනි 03 |
| | | ලී මිට සහිත උදැල්ල |
| | | පරණ යකඩ බාල්දිය |
| | | කොහු කඹ 02 |
| 46. | බී 1049/11 | යකඩ ඉනි 03 |
| | | උදැල්ල |
| 47. | බී 232/11 | අඟල් 10 x 8 ලී මිට සහිත උදැල්ල |
| 48. | අංක රහිත | අඟල් 9 x 9 ප්‍රමාණයේ උදලු තුනක් |
| 49. | නඩු අංක රහිත | සවල් 03 |
| 50. | නඩු අංක රහිත | මධ්‍යම ප්‍රමාණයේ වේවැල් කූඩ 07ක් |
| 51. | ඒ 360/11 | පරිගණකයක හෙඩ් ටොප් කොටස (මොඩ්ල් අංක පී. ආර්. 556 ඩී. පී. ආර්. සී. එල්. අයි. එස්. කේ.) |
| 52. | | හිස් සුදු පාට බෝතල් 750ක් පමණ |
| 53. | | හිස් යකඩ බැරල් 45 |
| 54. | | හිස් ප්ලාස්ටික් බූලි 40 |
| 55. | | වැලි කියුබ් 20ක් පමණ |
| 56. | | අධිකරණ කාර්යාලයේ වහලයෙන් ඉවත් කරන ලද උළු කැට 1500 ක් පමණ |
| 57. | නඩු අංක රහිත | වියලි පොල් ගෙඩි 200ක් |
| 58. | | කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද පැසිට් වර්ගයේ අංක 983368 දරන යතුරු ලියනය. |

06-50

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

පුත්තලම මුදලියාර් සේන එස්ටේට් පලසෝල ලිපිනයේ පදිංචි සෙබස්තියන් රෝහන ඉලයතම්බි වන මා විසින් නාවල, සේනානායක මාවත, 02 වැනි පටුමග, අංක 69/10 හි පදිංචි ඩිලක්ෂි ජිනප්‍රිය වෙත පවරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. වී. ද සිල්වා විසින් සහතික කළ අංක 1019 දරන 2012.12.14 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී ඩිලක්ෂි ජිනප්‍රිය විසින් මින් ඉදිරියට කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග කියනු නොලැබේ.

සෙබස්තියන් රෝහන ඉලයතම්බි.

06-114

## සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ මෙම දැනුම් දීම කරනු ලැබේ :

සමාගමේ නම : පටෙල් ලංකා ස්කන්ද (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 92179
දිනය : 2013.04.22
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 195, 2/1 (ඒ), කාල්ෂු කෝට්ස් බෙස්ලයින් පාර, කොළඹ 09.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.
දුරකථන අංක : 2433933, ෆැක්ස් අංකය : 2445683.

06-120

### ආයතනයේ නම වෙනස් කිරීම පිළිබඳ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 (2) උප වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

ආයතනයේ කලින් නම : සීලයින් පාර්මසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ආයතනයේ අංකය : පී. වී. 83754
ආයතනයේ ලියාපදිංචි ලිපිනය : අංක 1, ඇල්ප්‍රඩ් හවුස් ඇවනියු, කොළඹ 03
ආයතනයේ අලුත් නම : සී ලයින් පාර්මසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
නම වෙනස් කළ දිනය : 2013 අප්‍රේල් මස 19.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2013 මැයි මස 03 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

06-122

---

### සීමිත සමාගමක් ලෙස සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි උප වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

ආයතනයේ නම : සන්ෂයින් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ආයතනයේ අංකය : පී. වී. 76080, 2010.12.16
ආයතනයේ ලියාපදිංචි ලිපිනය : අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2013 මැයි මස 02 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

06-121

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම මහජනතාව වෙත දන්වා සිටිනු වග නම්, කොටුගොඩ, රජමාවත, රජවත්ත ටෙරන්ස්, අංක 83/ආර් හි පදිංචි විද්‍යාරත්න දොන් ලූකස් ඇන්ඩෲ යන මා විසින් කොටුගොඩ, රජමාවත, රජවත්ත ටෙරන්ස් අංක 83/ආර් හි පදිංචි සමරවීර ආරච්චිගේ කාන්ති වෙත පවරා ඇති ජයනි පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ අංක 4383 සහ 2011.09.19 දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත්, මින්මතු එකී ඇටර්නි බලපත්‍රය මත එකී මාගේ ඇටර්නි බලකාරිය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගනුදෙනුවකට මා වග නොකියන බවත් මෙයින් දැනුම් දෙමි.

06-127

---

### ඇටර්නි බලය අහෝසි කිරීම

කොළඹ 06, පාමන්කඩ පාර, සොලමන්ස් ඇවනිව් අංක 44/29 දරන ස්ථානයේ පදිංචි සන්ගරපිල්ලෙයි තරුමකුලසිංහම් (ජා. හැ. ප. අංක 393281120 V ) වන මම සෑම දෙනාටම දන්වා සිටින වගනම් මා විසින් චාවාකච්චේරි පරන්තන් සහ කෙරුඩාවිල් ඒ 9 පාරේ අම්බිකායිපාකන් නාගේන්ද්‍රන් (ජා. හැ. ප. අංක 383000211 V ) යන අයට බලය ලබා දී තිබූ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නාරායනස්වාමි මනෝහරන් විසින් සහතික කරන ලද අංක 2888 හා 2006 සැප්තැම්බර් මස 27 වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර අහෝසි කළ බවය.

එකී ඇටෝර්නි බලපත්‍රයට මෙදින සිට බලයක් හෝ නීතිමය ක්‍රියාදාමයන් නොමැත.

මින් ඉදිරියට මා වෙනුවෙන් මාගේ එකී ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන මොනයම් කටයුත්තකට හෝ මාගේ වගකීමක් නොමැත.

06-149/1

---

### ඇටර්නි බලය අහෝසි කිරීම

කොළඹ 06, පාමන්කඩ පාර, සොලමන්ස් ඇවනිව් අංක 44/29 දරන ස්ථානයේ පදිංචි සන්ගරපිල්ලෙයි තරුමකුලසිංහම් (ජා. හැ. ප. අංක 393281120 V) වන මම සෑම දෙනාටම දන්වා සිටින වගනම් මා විසින් වව්නියාව නුවර පාරේ අංක 160 හි සිවරට්නම් දේවකුමාර් (ජා. හැ. ප. අංක 522131369 V ) යන අයට බලය ලබා දී තිබූ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නාරායනස්වාමි මනෝහරන් විසින් සහතික කරන ලද අංක 2889 හා 2006 සැප්තැම්බර් මස 27 වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර අහෝසි කළ බවය.

එකී ඇටෝර්නි බලපත්‍රයට මෙදින සිට බලයක් හෝ නීතිමය ක්‍රියාදාමයන් නොමැත.

මින් ඉදිරියට මා වෙනුවෙන් මාගේ එකී ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන මොනයම් කටයුත්තකට හෝ මාගේ වගකීමක් නොමැත.

06-149/2

---

### වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

| | *සමාගමේ නම* | *සමාගමේ අංකය* | *ලියාපදිංචි . කාර්යාලය* |
|---|---|---|---|
| 1. | ජාහි විවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 86725 | අංක 438 බී, ප්‍රධාන වීදිය, මරදමුනෙයි 03 |
| 2. | ජාල් හෙල්ත් ඇන්ඩ් බියුටි ස්පා ඉන්වෙස්ට්-මන්ට් (පීවීටී) එල්ටීඩී | පී වී 87683 | අංක 113, රොබට් ගුණවර්ධන මාවත, කිරුළපන, කොළඹ 06 |
| 3. | කැරවැන් ලංකා හෝල්ඩින්ස් (පීවීටී) ලිමිටඩ් | පී වී 91527 | අංක 21/ඒ, මිලාගිරි ඇවනිවු, කොළඹ 04 |

එම්. සී. එම්. නවාස්,
සමාගම් ලේකම්.

06-153

### දැන්වීමයි

2007 අංක දරන 07 සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරන දැන්වීමයි

සමාගමේ නම : ට්‍රැවලර්ස් පැරඩයිස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 86845
සංස්ථාගත කළ දිනය : 2012.07.04
ලියාපදිංචි ලිපිනය : අංක 9/ඒ, හරමානිස් පටුමග, අත්තිඩිය.

සමාගම් ලේකම්.

06-156

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සන්රික් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 92011
සංස්ථාගත කළ දිනය : 2013.04.09
ලියාපදිංචි කාර්යාලය : අංක 4, මීගමුව පාර, බුලුපිටිය, උහුමීය, කුරුණෑගල.

අධ්‍යක්ෂ.

06-75

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2013 මැයි මස 9 වැනි දින සිට ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම : මැන්සන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 92433
ලියාපදිංචි ලිපිනය : අංක 9/5, තම්බයියා ඇවනියු, කොළඹ 7

ජේ සී සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවනියු,
කොළඹ 07.

06-74

---

### දැන්වීමයි

යුනිවර්සල් හෝල්ඩිංග්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (ඇ) වගන්තිය යටතේ යුනිවර්සල් හෝල්ඩිංග්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ගණන් බේරා වසා දැමීමට තීරණය කෙරෙන විශේෂ යෝජනා සම්මතයක් සමාගමේ කොටස් හිමිකරුවන් විසින් 2013 මැයි මස 28 වැනි දින සම්මත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2013 ජූනි මස 07 වැනි දින.
06-73/2

---

### ඈවරකරුවෙකු පත් කිරීමේ දැන්වීම

යුනිවර්සල් හෝල්ඩිංග්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

යුනිවර්සල් හෝල්ඩිංග්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි කොටස් හිමිකරුවන් විසින් 2013 මැයි මස 28 වැනි දින සම්මත කරගන්නා ලද සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින් සමාගමේ ඈවරකරු වශයෙන් කොළඹ 03, ගාලු පාර, අංක 142, යැතමා ගොඩනැගිල්ල, 3 වැනි මහල, මෙසර්ස් නානායක්කාර ඇන්ඩ් කම්පැණි හි ජී. කේ. සුදත් කුමාර වන මා පත් කරන ලද බව මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. කේ. සුදත් කුමාර,
ඈවරකරු.
යුනිවර්සල් හෝල්ඩිංග්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,

2013 ජූනි මස 07 වැනි දින.

06-73/1

---

### නිවේදනයයි

2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කෙරෙන පොදු නිවේදනයයි

සමාගමේ නම : ග්‍රෑන්ඩ් ලංකා ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91747
ස්ථාපිත කළ දිනය : 2013 මාර්තු මස 27 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : 82/46එෆ්, 14 වැනි පටුමග, ඒ, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

කේ. ඒ. ආර්. ආර්. පේමසිරි,
සමාගම් ලේකම්.

06-71

---

### සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීමේ පොදු නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 ඡේදයේ නියමයන්ට අනුකූලව "හේලීස් ග්ලෝබල් බෙවරේජස් (පීවීටී) එල්ටීඩී" 2013 මැයි මස 09 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නාමය : හේලීස් ග්ලෝබල් බෙවරේජස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 92432
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10
සංස්ථාගත කළ දිනය : 2013 මැයි මස 09 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ග්ලෝබල් බෙවරේජස් (පීවීටී) එල්ටීඩී,
හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10
2013 මැයි මස 17 වැනි දින.

06-70

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඩෙස්ටිනි ඩී. ජේ. එස්. ඇන්ඩ් ඉවෙන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 90346
ලියාපදිංචි කාර්යාලය : අංක 35/5 ඒ, කුඩා බුත්ගමුව, අංගොඩ.

06-68/1

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඉරාජ් ප්‍රඩක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 87875
ලියාපදිංචි කාර්යාලය : අංක 59/2, එඩ්මන්ටන් පාර, කිරුලපන, කොළඹ 05.

06-68/2

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ද කැටලිස්ට් ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 91858
ලියාපදිංචි කාර්යාලය : අංක 18, බෝවිල පාර, පහල බෝමිරිය, කඩවත.

06-68/3

---

### නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කර සිටිමි.

සමාගමේ නම : ගන්ලෝ ට්‍රැවල් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92513
සංස්ථාගත කිරීමේ දිනය : 2013 මැයි 14
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 157/3ඒ, හෙට්ටිකන්ද පාර, පරකන්දෙනිය, ඉඹුල්ගොඩ.

අධ්‍යක්ෂ.

06-67

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය, 2013 ජනවාරි මස 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කර ඇති බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : එම් ඇන්ඩ් සී මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 9664
සමාගමේ නව නාමය : ෆ්ලෙමින්ගෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

ගලධාරි හෝටලය,
අංක 64, ලෝටස් පාර,
කොළඹ 01.

06-66/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය, 2009 පෙබරවාරි මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කර ඇති බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : ඩිංගෝ ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 62446
සමාගමේ නව නාමය : කෝටඩ් ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

ගලධාරි හෝටලය,
අංක 64, ලෝටස් පාර,
කොළඹ 01.

06-66/2

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ග්‍රීන් ෆයර්සප්ලයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92345
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 39, ලයිට්හවුස් වීදිය, ගාලු කොටුව, ගාල්ල
සංස්ථාපිත දිනය : 2013 මැයි මස 03.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-65

### සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගමේ නම 2013 ජනවාරි 07 වැනිදා සිට වෙනස් වූ බව මෙයින් දන්වමු.

පෙර තිබූ නම : පියුමත් (ප්‍රයිවට්) ලිමිටඩ්
නව නාමය : පියුමත් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89554
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 59/1, හල්පෙ පටුමග, කඳාන.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-64/2

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ජොයින්ට් අග්‍රි ප්‍රඩක්ට් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92276
ලියාපදිංචි කාර්යාලය : අංක 165, දිප්පිටිගොඩ, දලුගම, කැලණිය,
සංස්ථාපිත දිනය : 2013 අප්‍රේල් මස 29 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-64/1

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ශක්ති ඉයුරේෂියා එක්ස්චේන්ජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 25/ඒ, නුගේතුඩුව පාර, පොල්වත්ත, අම්බලන්ගොඩ
සංස්ථාගත කළ දිනය : 2013 මැයි 10 වැනි දින
ලියාපදිංචි අංකය : පී වී 92479

ලේකම්.

06-60

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ඇබකස් සිස්ටම්ස් කන්සල්ටින් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2013.05.14
3. සමාගමේ අංකය : පී. වී. 92507
4. ලියාපදිංචි ලිපිනය : අංක 31, විජයරාම ලේන්, නුගේගොඩ.

ඩී. සී. ප්‍රනාන්දු,
ලේකම්.

06-16

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ගුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92408
ලියාපදිංචි කාර්යාලය : එලටන්, නව ගුරුකෙල්ල, දොලුව, ගම්පොල
සංස්ථාපිත දිනය : 2013 මැයි 08

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-17

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : ගීනර් වෝටර් වන් ලිමිටඩ්
සමාගමේ අංකය : පී බී 3858
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 27 ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, ඉචෙලන් චතුරශ්‍රය, කොළඹ 01
සමාගමේ අළුත් නම : සමර් සීසන් ලිමිටඩ්
නම වෙනස් කළ දිනය : 2013 මැයි මස 16 වැනි දා

සමර් සීසන් ලිමිටඩ් සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී. ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

06-18

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ලංකා මිනරල් රිසෝර්ස් එක්ස්පෝටර්ස්
සමාගමේ අංකය : පී. වී. 91983
ලියාපදිංචි කළ දිනය : 2013.04.10
ලියාපදිංචි කාර්යාලය : අංක 2/11, සම්නර් පෙදෙස, බොරැල්ල.

එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

06-04/1

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : නෙළුම් වැව ඇසෙට් කො (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91716
ලියාපදිංචි කළ දිනය : 2013.03.25
ලියාපදිංචි කාර්යාලය : අංක 23 ඒ 2, එම්පයර් රෙසිඩන්සිස්, බේබෲක් පෙදෙස, කොළඹ 02.

එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

06-04/2

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ඒෂියන් ඉන්වෙස්ටර් ෆැසිලිටේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92133
ලියාපදිංචි කළ දිනය : 2013.04.18
ලියාපදිංචි කාර්යාලය : අංක 14, ශ්‍රී ධම්මකීර්තියාරාම පාර, කොළඹ 03.

එෆ්. ඒ. කෝපරේට් සර්විසස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

06-04/3

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 34 වැනි වගන්තිය සමග වූ 5 වැනි වගන්තිය යටතේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : නාමල් ජීවානන්ද ෆවුන්ඩේෂන්
සමාගමේ ලියාපදිංචි අංකය : ජී. ඒ. 2566
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 273, ග්‍රාමෝදය මාවත, ඔබේසේකරපුර, රාජගිරිය
සංස්ථාගත කිරීමේ දිනය : 2011 ජූනි 20 වැනි දින.

06-45

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි

සමාගමේ නම : රැඩිකල් රිපබ්ලික් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 92199
සංස්ථාගත කළ දිනය : 2013 අප්‍රේල් මස 23 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 44/ඒ, පළමුවැනි හරස් වීදිය, පාගොඩ, නුගේගොඩ.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-28/3

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ඩයිසර් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91941
සංස්ථාගත කිරීමේ දිනය : 2013 අප්‍රේල් මස 05 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 33, බටහිර කුළුණ, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-28/4

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2013 පෙබරවාරි මස 18 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : නේටිව් ෆ්ලෝරා සැන්චුවරි
සමාගමේ අංකය : ජී. ඒ. 2789
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 32 බී, බාර්න්ස් පෙදෙස, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

06-30

## නිවේදනයයි

ස්ක්‍රීන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් ("SPL") සහ ස්ක්‍රීන්ලයින් එම්බෙලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ("SEPL")ඒකාබද්ධ කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද බව සහ ඒකාබද්ධ කිරීමේ සහතිකයක් 2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (1) (ඒ) වගන්තිය ප්‍රකාර සමාගම් රෙජිස්ට්‍රාර් විසින් 2013 මැයි 03 වැනි දින නිකුත් කරනු ලැබ ඇති බවත් 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(3) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංස්ථාගත කරන ලද සමාගම වන ස්ක්‍රීන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ලියාපදිංචි කාර්යාලය කැලණිය, ගෝනවල, තල්වත්ත, අංක 18/4 දරන ස්ථානයෙහි ඇත.

ස්ක්‍රීන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සභාපති.

2013 මැයි මස 09 වැනි දින.

06-27/1

## ප්‍රසිද්ධ නිවේදනයයි

කලරිට් (ප්‍රයිවට්) ලිමිටඩ් 2013 මැයි මස 03 වැනි දින සිට සිය නාමය 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියෙහි ප්‍රතිපාදනවලට අනුකූලව ස්ක්‍රීන්ලයින් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කරන ලද බව එම පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරන ලැබේ.

සමාගමේ කලින් තිබූ නම : කලරිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 6910
ලියාපදිංචි කාර්යාලය : 17, හාර්මර්ස් ඇවනියු, වැල්ලවත්ත, කොළඹ 06
සමාගමේ නව නාමය : ස්ක්‍රීන්ලයින් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

ස්ක්‍රීන්ලයින් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-27/2

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

සමාගමේ නාමය : හයික්ලිෆ් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91597
සංස්ථාගත කළ දිනය : 2013 මාර්තු 25 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 141/3, වොක්සෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-28/2

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ඩයිසර් ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91984
සංස්ථාගත කිරීමේ දිනය : 2013 අප්‍රේල් මස 08 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 33, බටහිර කුළුණ, එචිලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-28/5

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි.

සමාගමේ නම : එම් ආර් එල් ග්‍රැෆයිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92009
සංස්ථාගත කළ දිනය : 2013 අප්‍රේල් මස 10 වැනි දින
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 33, බටහිර කුළුණ, එචිලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-28/1

**ප්‍රසිද්ධ දැන්වීමයි**

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

| *සමාගමේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|
| හැපි වැලි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 92241 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| ලව්යන්ග් ඉන්වෙස්ට්මන්ට්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 92439 | එම |
| සිට්රින් සෑන්ඩ්ස් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 92494 | එම |

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

06-42

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව**

දේපළ දෙකක් වෙන්දේසියේ විකිණීම අවලංගු කිරීම

2013 මැයි මස 17 වැනි දින අංක 1811 දරන රජයේ *ගැසට් පත්‍රයේ* 1 වැනි කොටස (II ආ) ඡේදය පළකිරීමේ කොටසෙහි වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් යටතේ අතපසුවීමකින් පළ වූ වෙන්දේසියේ විකිණීම් දෙකක්, අදාල ඉඩම් මත සෙලාන් බැංකුව වෙත අයවිය යුතු සියලුම මුදල් ගෙවා අවසන් බැවින් අවලංගු කර ඇත.

**2 වැනි වෙන්දේසියේ විකිණීම සහ 3 වැනි වෙන්දේසියේ විකිණීම**

අත්තිඩිය උපනන්ද මාවතේ පිහිටි අංක 259 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 5 සහ ලොට් 6 දරන දේපළ දෙකට අදාල වෙන්දේසිය අත්හිටුවා ඇති බැවින් 2013 ජුනි මස 12 වැනි දින පෙරවරු 10.00 ට සහ පෙරවරු 10.15 ට පැවැත්වීමට නියමිත දේපළ වෙන්දේසි දෙක නොපැවැත්වෙන බව දන්වා සිටිමි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

06-154

**හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. - මොරටුමුල්ල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විකිණීමයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලෙ පත්තුවේ මොරටු මහ නගර සභා සීමාව තුළ කටුබැද්දේ පිහිටි පොල්කොටුව පාරේ වරිපනම් අංක 79 දරන "කඳුරුගහ කුඹුර"නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව්. කාවෝලෝ විසින් සාදන ලද 2001 අප්‍රේල් මස 20 දාතම හා අංක 1378 දරන පිඹුරේ නිරූපිත ලොට් 1හි උප බෙදුමක් හා නැවත මනින ලද කොටසක් වන, බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 2003 ජුනි මස 14 දාතම හා අංක 1932 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් නිරූපිත ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම නමයයි හතරක් (අක්. 0 රූඩ් 0 පර්. 11.94) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ බිම් කොටස.

එකී අංක 1932 දරන පිඹුරේ ලොට් 4 (අඩි 10ක් පළල මාර්ගය) ලෙස ලකුණු කොට දක්වා ඇති ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම බිංදුවයි හතරක් (අ. 0 රූඩ් 0 පර්. 3.04)ක් වන අඩි 10ක් පළල පාර ඔස්සේ, මතින් හා අතරින් මාර්ග අයිතිය ද, හා සමගය.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය.* - ගාලු පාර ඔස්සේ රාවතාවත්ත ප්‍රදේශය කරාගොස් ආරක්ෂක කුටිය හා කටුබැද්ද හන්දිය පසුකොට වම්පස පිහිටි රාවතාවත්ත පාරට අවතීර්ණව සෙලාන් බැංකුව පසුකොට ටික දුරක් ගියවිට හමුවන පොල්කොටුව පාර නමැති තාරදැමූ රථවාහන ගමන් කළ හැකි බෞද්ධ පන්සල් පරිශ්‍රය වෙත දිවෙන මාර්ගය ඔස්සේ ගමන් කළ විට වම්පස පිහිටි මෙම ඉඩම හමුවේ.

දොඩම්පහලගේ අනෝජන් ප්‍රියලාල් ප්‍රනාන්දු යන අයට බැදුම්කරු වශයෙන් ප්‍රදානය කල ණය පහසුකම් වෙනුවෙන් හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත උකස් කරන ලද ඉහත විස්තර කළ දේපළ 2013 ජූලි 1 වැනිදා සඳුදා පෙ. ව. 10.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2012 නොවැම්බර් මස 16 වැනිදා රජයේ ගැසට් පත්‍රය ද, 2013 මාර්තු 18 වැනිදා "ඩේලි මිරර්" "ලක්බිම" හා "තිනකරන්" පුවත්පත් ද බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල.-* සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) දේශීය විකුණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජය හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අයබදු, තීරුබදු හෝ අයකිරීම් අදාළ වේ නම් ඒවා ද, සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ. හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, හැටන් නැෂනල් බැංකුව, පී. එල්. සී. සහකාර සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

දුරකථන අංක : 011- 2661816 ෆැක්ස් අංකය : 2661835.

ඩැලස් කෙලාට් ඔක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
විශේෂඥ වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ වෙළෙන්දෝ.

අංක 146/3, කල්දේරා ගාඩින්ස්,
දුටුගැමුණු වීදියෙන් හැරී,
කොහුවල.
දුරකථන අංක : 011-4302622/011-4302623, ෆැක්ස් අංකය : 2856013.

06-147

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ දැන්වීම

ණය යොමු අංකය : 72027004

2013.03.22 දිනැති අංක 1803 දරන *ගැසට් පත්‍රයේ* හා 2013.03.08 දිනැති "ඩේලි නිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2013.06.29 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩි ඔක්ෂන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ පිහිටි ගොඩපරගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1998 සැප්තැම්බර් මස 14 දිනැති අංක 880 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : අඩි 10 පළල පාර ද, නැගෙනහිරට : අංක 880 දරන පිඹුරෙහි ලොට් 3 ද, දකුණට : අයි. ඩී. එච්. ගුණවර්ධන හා වෙනත් අය විසින් උරුමකම් කියනු ලබන ඉඩම ද, බස්නාහිරට : අංක 1409 දරන පිඹුරෙහි ලොට් 2 ද, මායිම්ව එකී අංක 880 දරන පිඹුරට අනුව පර්චස් 10 ක (අ. 0 රූ. 0 පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1791/237 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට එකී අංක 880 දරන පිඹුරෙහි දක්වා ඇති පාරට වෙන්කළ කොටස මතින් පාරේ අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

එස්. එම්. ජී. ජේ. සී. සිප්කඩුව මහතා,
කළමනාකරු.

2013 අප්‍රේල් මස 29 වැනි දින,
ලංකා බැංකුව,
කොට්ටාව.

06-137

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශේෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිළ දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| ජුනි | 2013.06.07 | සිකුරාදා | 2013.05.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.06.14 | සිකුරාදා | 2013.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.21 | සිකුරාදා | 2013.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.28 | සිකුරාදා | 2013.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2013.07.05 | සිකුරාදා | 2013.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.12 | සිකුරාදා | 2013.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.19 | සිකුරාදා | 2013.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.26 | සිකුරාදා | 2013.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2013.08.02 | සිකුරාදා | 2013.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.08 | බ්‍රහස්පතින්දා | 2013.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.16 | සිකුරාදා | 2013.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.23 | සිකුරාදා | 2013.08.08 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.08.30 | සිකුරාදා | 2013.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.